


## පිස්සා මේ පිස්සු පූසා මේ (Lyrics)

**සූට් බූට් දිග කලිසම් රෝල්ස් රොයිස් ගමන් බිමන්**
**අද මැදුරේ හෙට පැදුරේ පිස්සා මේ පිස්සු පූසා මේ**
**පිස්සා මේ පිස්සා මේ පිස්සු පූස මේ...//**

**තම වලිගය අල්ලන්නට වටේට කැරකෙන පූසා**
**මේ විගඩම දැකගන්නට කවුරු නොවෙද ආසා**
**දෙස් පලුවෙක් ගේ විලසා කුණු කූඩෙන් බෙල්ල දමා**
**බොරු බේගල් ඇද දමලා - සහචරයින් කරයි මුලා...**

**පිස්සා මේ පිස්සා මේ පිස්සු පූස මේ...//**

**අන් කුසගිනි නිවන නියා කට බලියන් ඉන්න එකා**
**මීයා කටට වැටුනු වහා සිල්ගත් සේමා**
**තම වාසිය ලැබෙන තුරා පුරු පුරු ගා කෙඳිරි ගගා**
**බිම පෙරලෙයි වැඳ වැටිලා - කකුලෙ වෙලෙයි මේකා...**

**පිස්සා මේ පිස්සා මේ පිස්සු පූස මේ...//**

**හොරා කෑම බැරිවුන දා දත් විලිසා නිය විහිදා**
**කොන්ද නවා දූන්න ලෙසා පහුරු ගායි පූසා**

**පිස්සා මේ පිස්සා මේ පිස්සු පූස මේ...//**

-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-

**ගායනය: ගැමුණු විජේසූරිය**

-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-_-

*Website:* https://psdanthony.wordpress.com

*Facebook:* https://www.facebook.com/psdanthony

*Instagram:* https://www.instagram.com/psd_anthony

*YouTube:* https://www.youtube.com/channel/UCzRi-FPeQlez-931zY_0htw

Psd Anthony